**පොල් පර්යේෂණ මණ්ඩලය - 2017**

-----------------------------------------------

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 මැයි 18 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පොල් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා ඇති කම්කරුවන් වෙත ලබා දී ඇති උත්සව අත්තිකාරම් හා විශේෂ වැටුප් අත්තිකාරම් තුල පිළිවෙලින් රු. 68,475 ක් හා රු. 90,865 ක් වූ සෘණ ශේෂයක් හිලවු කර ශුද්ධ ශේෂය වූ රු.467,519 ක් හා රු.181,581 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති රු.6,190,814 ක ස්ථාවර තැන්පතු සඳහා වූ පොලී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල්මය නොවන වෙනස්වීම් යටතේ රු.6,904,083 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.713,269 ක් අඩුවෙන් නිරූපණය විය.

(ii) මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර තැන්පතු සඳහා මුදලින් ලද පොලී ආදායම රු.5,011,893 ක් වුවද රු.6,190,814 ක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු. 1,522,283,874 ක ඉඩම්, මණ්ඩලය විසින් 2005 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.208,560,016 ක් වූ දේපල හා පිරියත සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් තබ්බෝව පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 5 ක් වූ ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.507,637 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබූ රු.6,616,827 ක විදේශ ආධාර, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපණය විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණයගැතියෝ | 7,541,354 | ශේෂ සනාථන ලිපි |
| ණයහිමියෝ | 1,916,781 | |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 3,055,587 | වාර්ෂික තොග |
| රසායනාගාර උපකරණ | 2,357,168 | සමීක්ෂණ වාර්තා |

**2.3 ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු. 7,750,786 ක් වූ ණය ගැතියන්ගෙන් රු. 539,737ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති ආයතන 13 කින් අයවිය යුතු ආරක්ෂිත තැන්පතු රු.245,650 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පවතින අතර එය අය කර ගැනීමට මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් මුදල් පොත් දෙකක් අතර රු.126,000 ක ලදුපත් සටහන් කිරීමේදී සිදුව තිබූ වරද නිවැරදි කිරීමට කටයුතු නොකර එම අගය මූල්‍ය ප්‍රකාශන වල මාර්ගස්ථ මුදල් ලෙස දක්වා තිබුණි.

(ඈ) 2012 වර්ෂයේ නව ඇලුමිනියම් දොරවල් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ලබා දී ඇති රු. 159,936 ක් පූර්ව වැඩ සඳහා වු අත්තිකාරම් මුදලක් 2017 දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි.

(ඉ) පෞද්ගලික ආයතන 20 කින් ලබාගෙන ඇති වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පවතින රඳවා ගැනීමේ මුදල් රු. 407,286 ක් හා සෙස් අරමුදලින් රඳවා ගැනීම් රු. 424,352 ක ශේෂයක් වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී 03/2017 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ප්‍රසාද දීමනා ලෙස වතු කළමනාකරණ අංශයේ ස්ථිර නිලධාරීන් 36 දෙනෙකුට රු.10,000 බැගින් රු.360,000 ක් ගෙවිය යුතු වුවද චක්‍රලේඛයට පරිබාහිරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අදාල සේවකයන්ගේ මාසික මූලික වැටුප පදනම් කරගෙන එකතුව රු.883,272 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ආ) 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය - 02 ඡේදය | රජය විසින් ඍජුව හා චක්‍රාකාර ලෙස අරමුදල් සපයන ආයතන හා රජය වෙත ඍජුව හා චක්‍ර ලෙස අවසාන වගකීම් පැවරෙන අරමුදල්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ජාතික ආර්ථිකයට වඩාත් යහපත් ප්‍රථිඵල ගෙන දෙන විධිමත් ආයෝජන පිළිවෙතක් අනුගමනය කල යුතු වුවද, සමාලෝචිත වසර තුල රු. මිලියන 08ත් රු. මිලියන 103ත් අතර පරාසයක ශේෂයක් නිෂ්ක්‍රියව බැංකු ජංගම ගිණුම් 4ක රඳවාගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,752,992 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,733,096 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,980,104 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පර්යේෂණ මධ්‍යස්ථාන ආදායම් රු.13,740,363 කින් වැඩිවුවද වැටුප් හා වේතන ප්‍රතිලාභ වියදම් රු.15,471,987 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරිමේදී 2013 වර්ෂයේ රු. 40,702,143 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.70,181762 ක් දක්වා වර්ධනය වී තිබුණද 2015 වර්ෂයේ සිට අඛණ්ඩව පිරිහී 2017 වර්ෂය වන විට අතිරික්තය රු. 26,752,992ක් දක්වා අඩු වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු.211,637,093 වූ දායකත්වය විචලනයන් සහිතව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 251,806,285 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේ දි සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය 1 : 1.74 සිට 1 : 1.35 දක්වා අඩු වී තිබූ අතර ක්ෂණික වත්කම් අනුපාතය 1 : 1.33 සිට 1 : 0.96 දක්වා අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේ දි සමාලෝචිත වර්ෂයේ දී ලාභදායී අනුපාතය සියයට 5.5 සිට සියයට 5.04 දක්වා අඩු වී තිබුණි.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

------------------------------------------------------------------------------------------

මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 09 දෙනෙකුට එරෙහිව එකතුව රු.15,629,888 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 09 ක් පවරා තිබුණු අතර බාහිර පාර්ශවයන් විසින් මණ්ඩලයට එරෙහිව නඩු 03 ක් පවරා තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

## 4.1 කාර්යසාධනය

----------------

### 4.1.1 ක්‍රියාකාරිත්වය සහ සමාලෝචනය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරුණු කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු වතු 10 හි 2016 වර්ෂයේ ගෙඩි 5,689,864 වූ පොල් ඵලදාව සමාලෝචිත වර්ෂය වන විට සියයට 31 ලෙස ගෙඩි 3,917,072 දක්වා අඩු වී තිබුණි. එමෙන්ම අක්කරයක සාමාන්‍ය වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 2400 ත් 3000 ත් අතර විය යුතු වුවත් මණ්ඩලය සතු වතු 10 න් වතු 05 ක පොල් ඵලදාව ඊට අඩු අගයක් වූ අතර ගසක සාමාන්‍ය වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 60 ක් විය යුතු වුවත් මණ්ඩලය සතු වතු 5ක ගසක වාර්ෂික සාමාන්‍ය වාර්ෂික ඵලදාව ගෙඩි 21 සිට 48 පරාසයක විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.543,000 වූ පර්යේෂණ ව්‍යාපෘති **02** ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.7,617,000 වූ පර්යේෂණ ව්‍යාපෘති 16 ක කාර්යසාධන මට්ටම සියයට 10 ත් සියයට 8 ත් අතර පරාසයක විය. මෙයට ප්‍රධාන වශයෙන් පර්යේෂණ නිලධාරින්ගේ හිඟය, රසායනික ද්‍රව්‍ය නොලැබීම, රසායනාගාර උපකරණ මිලදී ගැනීම ප්‍රමාද වීම හේතුවී තිබුණි.

(ඈ) පුස්තකාල සහ ඉංජිනේරු සේවා අංශයේ යටිතල හා සංවර්ධන ව්‍යාපෘතින් 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම අනුව රු. මිලියන 4 ක් ප්‍රතිපාදනය කර තිබුණද, නියමිත කාලය තුල භාණ්ඩ මිලදී ගැනිමට නොහැකි වීම නිසා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් නව පොල් ප්‍රභේද හඳුන්වා දීම සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු දිගින් දිගටම සිදු කළත් 2013 වර්ෂයෙන් පසු නව පොල් ප්‍රභේද හඳුන්වා දීමක් සිදුකර නොතිබුණි. හඳුන්වා දී තිබු පොල් ප්‍රභේද 06 ක් අතුරින් කප්රුවන, කප්සෙත සහ කප්සුවය යන පොල් ප්‍රභේද ජනතාව අතර ව්‍යාප්ත වී නොතිබුණි.

(ඉ) පොල් මයිටා හානිය වැලැක්වීමට අවශ්‍ය වන විලෝපිත මයිටා පැකට් නිෂ්පාදනය කිරීමට නොහැකි වීම සහ උස පොල්ගස් වලට විලෝපිත මයිටා පැකට් දැමීමට ක්‍රමයක් සකසා නොතිබූ නිසා පසුගිය වර්ෂ 5 තුළ මණ්ඩලයට අයත් පොල් වතු 10 හි 2013 වර්ෂයේදී 342,051 ක් වූ මයිටා හානියට ලක් වූ පොල් ගෙඩි ප්‍රමාණය සමාලෝචිත වර්ෂය වනවිට 467,034 ක් දක්වා සියයට 36 කින් වැඩි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් පර්යේෂණ මණ්ඩලය විසින් සොයා ගන්නා ලද ජාතික වශයෙන් වැදගත් වූ පර්යේෂණාත්මක ප්‍රතිඵල වෙනත් රටවල් සමඟ හුවමාරු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහ අමාත්‍යංශ අනුමැතිය ලබාගත යුතු වුවත් මණ්ඩලය විසින් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉන්දියානු විදේශ සමාගමක් සමඟ පටක රෝපණ තාක්ෂණයේ පර්යේෂණාත්මක ප්‍රතිඵල හුවමාරු කර ගෙන තිබුණි.

(ආ) මාකඳුර ජාන සම්පත් මධ්‍යස්ථානය බීජ පොල් උයනක් ලෙස 1984 ජුලි 21 දින සිට ස්ථාපනය කර තිබුණ ද පොල් ගස් අකල් පරිහානි තත්වයකට පත්වීම නිසා බීජ පොල් ලබා ගැනීම නවතා දමා අතුරු වගා ආදර්ශයක් ලෙස පවත්වා ගැනීමට කටයුතු කරමින් තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

පොල් කටු අඟුරු නිෂ්පාදනයේ දී පිටවන තාපය පරිසරයට මුදා නොහැර එම තාපය යොදාගෙන කොප්පරා වියලීම අරමුණු කොටගෙන රු.1,719,250 ක වියදමක් දරා බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානයේ තාප සුරැකුම් ඒකකයක් 2008 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද අළුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් එය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 391 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය සේවක සංඛ්‍යාව 287 ක් වූ අතර තනතුරු 31 ක් සඳහා පුරප්පාඩු 104 ක් පැවතුණි. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 27 ක පමණ පුරප්පාඩු පැවතීම, මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනීමට බාධාවක් වී තිබුණි.

**5.** **තිරසාර සංවර්ධනය**

**5.1** **තිරසාර සංවර්ධන හා අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාළව පොල් පර්යේෂණ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධන ඉලක්ක කර ළඟාවීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂක අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, අධිකාරිය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හී ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව ක්‍රියා කිරීම හා සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම් නැවත ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | i. | ආයතනයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් පටිපාටිය අනුව අදාළ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| | | ii | නිලධාරීන් තනතුරු වලට බඳවා ගැනීමෙන් පසු ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතිකවල නිවැරදිතාවය එම ආයතන වලින් සනාථ කර නොගැනීම. |
| (ඇ) | වතු කළමනාකරණය | | පොල් එලදාව වැඩි කිරීමට, නව පොල් ප්‍රභේද හඳුන්වා දීමට සහ පොල් වගාවට හානි කරන පලිබෝධකයන් මර්ධනයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබීම. |